176

EWIS PERIPHERALS (PVT) LTD.

14

05 DEC 2025

RECEIVED

කළමණාකරු.

Ewis peripherals (Pvt) Ltd

මහත්මයාණෙනි/මහත්මියණි.

2026 ජනවාරි 01 දින සිට 2026 දෙසැම්බර් 31 දින දක්වා ප්‍රතිචක්‍රීකරණ ද්‍රව්‍ය විකිණීම සඳහා මිල ගණන් <u>කැඳවීම.</u>

1. ගම්පහ මහා නගර සභා ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානවල එකතු වන ප්‍රතිචක්‍රීකරණ ද්‍රව්‍ය විකිණීම සඳහා විවෘත මිල ගණන් කැඳවනු ලැබේ.

2. මේ සමග ඉදිරිපත් කර ඇති ඇමුණුමේ පරිදි ඉදිරිපත් කරනු ලබන මිල ගණන් කැඳවීමේ පෝරම මුල් පිටපත හා අනු පිටපත වශයෙන් වෙන වෙනම කවර දෙකක බහා මුද්‍රා තබා එම කවර දෙකම එක් කවරයක බහාලීමෙන් අනතුරුව එයද මුද්‍රා තබා කවරයේ වම්පස ඉහළ කෙළවර "ප්‍රතිචක්‍රීකරණ ද්‍රව්‍ය සඳහා මිල ගණන් කැඳවීම - 2026" ලෙස පැහැදිලිව සඳහන් කර 2025/12/24 දින පෙ.ව. 10:00 ට පෙර ලැබෙන සේ නාගරික කොමසාරිස්,ගම්පහ මහා නගර සභාව.ගම්පහ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ නාගරික කොමසාරිස් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම සිදු කළ යුතුය.

3. මිල ගණන් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය මහා නගර සභාව සතු වේ.

4. ඔබ ආයතනය මෙම මිල ගණන් ඉදිරිපත් නොකරන්නේ නම් ඒ බව හෝ සඳහන් කර එවන මෙන් කාරුණිකව දන්වමි.

5. බදු සහිත සහ බදු රහිත මිල ගණන් වෙන වෙනම ලබා දීම කළ හැක.එසේ නොවුණහොත් රජයේ බදු ඇතුළත් මිල දක්වනු ලබන මිල ලෙස සැළකේ.

6. දෙපාර්ශවයේ එකඟතාවය මත තෝරා ගත් ස්ථානයක තරාදියක් මගින් බර කිරා ගැනීමෙන් පසු ඉදිරිපත් කරනු ලබන බර රිසිට්පත් අනුව ගෙවීම් සිදු කෙරේ.

7. තෝරා පත්කරනු ලබන අයදුම්කරුවන් සමග සභාව විධිමත් පරිදි ගිවිසුම් ගත වනු ලැබේ.

8. සමාගම් ලියාපදිංචි සහතිකය හෝ තනිපුද්ගල ව්‍යාපාර ලියාපදිංචි සහතිකයෙහි සහතික කළ පිටපත් ඉදිරිපත් කළයුතුය.

නාගරික ගණකාධිකාරි,

මහා නගර සභාව,

ගම්පහ.

පී. ජී. ඩී. යු. රත්නසේකර
නාගරික ගණකාධිකාරි
මහා නගර සභාව
ගම්පහ